# 23 සමාජ සාධාරණත්වය කරා

ආමොස් දිවැසිවරයා එදා පැවති සමාජීය තත්ත්වය තුළ යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් ඔහුගේ හඬ අවදි කළ ආකාරයත් එය අපගේ ජීවිතයට අදාළ කර ගත හැකි ආකාරයත් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

ආමොස් 4, 5 පරිච්ඡේද

## ආමොස් සේවය කළ පසුබිම

ආමොස් දිවැසිවරයා සිය දිවැසිවර සේවය සිදු කළේ ඉශ්රායෙල් දේශයේ උතුරු රාජ්‍යයේ ය.

ආමොස් දකුණු දිශාවේ පිහිටි ජුදා දේශයෙහි තෙකෝවාහි ගම් වැසියෙකි. හෙතෙම බැටළු එඬේරකු මෙන් ම අත්තික්කා වගා කරන්නකු ද විය. ඔහු වෘත්තීය දිවැසිවරයකු නොවූවත් දිවැසිවර කාර්යය හොඳින් ඉටු කළ කෙනෙකි.

ක්‍රි.පූ. 8 වන ශත වර්ෂයේ මැද භාගයේ හෙතෙම දිවැසිවර සේවයේ නියැලුණි. ඒ කාලයේ උතුරු රාජ්‍යය පාලනය කළේ දෙවන ජෙරබෝවම් රජතුමා ය.

මේ සමයේ දේශය කිසියම් ආකාරයක ආර්ථික දියුණුවකට පත් වී තිබුණි. උතුරු රාජ්‍යය ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයක් වූ නිසා මතුපිටින් විශාල ආර්ථික සංවර්ධනයක් පෙන්නුම් කළේ ය. ඉශ්රායෙල් රජතුමා සහ රටේ ප්‍රභුවරු, විශේෂයෙන්ම අග නගරය වූ සමාරියාවේ ප්‍රභුවරු විදේශීය අධිරජවරුන් සමග නොයෙකුත් ආර්ථික ගිවිසුම් ඇතිකර ගත්හ. ඒ නිසා ඔවුනට බොහෝ ලාභ ප්‍රයෝජන අත් වූ නමුදු, විදේශීය රජවරුන් සමග ඇතිකර ගත් ගිවිසුම්වල අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබුවේ දිළිඳුන්ගෙන් අධික ලෙස බදු අයකිරීමෙනි. මේ හේතුවෙන් ධනවත් නිලධාරි හා ප්‍රභු පන්තිය ඉතා සුඛෝපභෝගි ජීවිත ගතකළ අතර දිළිඳුහු ඉතා දුගී තත්ත්වයකට පත්වූහ. එමෙන් ම ඔවුහු දැඩි පීඩනයකට හා සූරාකෑමට ලක් වූහ. දුගී ජනතාව ගැන ධනපති වෙළඳුන් දැරූ ආකල්පය ආමොස්තුමා මෙලෙස විස්තර කරයි. එනම් 'දුප්පතා සල්ලිවලට ද, දුගියා සෙරෙප්පු දෙකක මිලට ද ගත හැකිය' යන්නයි. මින් පෙනී යන්නේ දුගී මිනිසකු සතු වටිනාකම සෙරෙප්පු දෙකක වටිනාකමට වඩා වැඩි නො වන බවක් ඔවුන් සිතූ බවයි. මෙලෙස ඔවුහු මානව වටිනාකම් පහළ තත්ත්වයකට ඇද දැමූහ. සමාරිය අගනුවර කර ගත් ධනපතීහු සුඛෝපභෝගී නාගරික ජීවිතයක් ගත කළහ.

එහෙත් නගරයෙන් පිට ජීවත් වූ කෘෂිකර්මය, එඬේර වෘත්තිය හා අනෙකුත් කම්කරු කාර්යවල නියැලුණු අය හා නාගරික ධනපතීන් අතර තිබුණේ විශාල පරතරයකි. එය ඇතිවූයේ සූරා කෑම හා දුප්පතුන් සතු වස්තුව කොල්ලකෑම නිසා ය.



ආමොස් දුටු දර්ශනයක් - (ලඹ ලණුව)

මී ළඟට අපි ආමොස් දිවැසිවරයාගේ දිවැස් වැකි කිහිපයක් ගැඹුරෙන් සලකා බලමු.

කියවා බලමු.

**ආමොස් 4,5 පරිච්ඡේද**

### අසාධාරණ අයුක්ති සහගත ක්‍රියාකාරකම්

සමාරියේ ජීවත් වූ ධනපතීන්ගේ භාර්යාවන් ආමොස් හඳුන්වන්නේ "තරබාරු එළදෙනෙකු" ලෙස ය. එසේ දක්වන්නේ ඔවුන් "දිළිඳුන් තළා පෙළන, අසරණයන්ට පීඩා කරන" පිරිසක් වූ හෙයිනි. දේව විනිශ්චය දරුණු ලෙස ඔවුන් මත පැමිණෙන බව ඔහු දැන්වී ය.

එලෙස ම ධනවත් ප්‍රභූ පංතිය යුක්තිය ඉටුවේ යයි අපේක්ෂා කරනු ලබන උසාවි ක්‍රමයට ද බලපෑම් කළහ. ඔවුහු අල්ලස් දෙමින් හා අල්ලස් ගනිමින් දුප්පතා සඳහා යුක්තිය ඉටුවීම වැළැක්වූහ. (5: 12). මෙලෙස යුක්තිය ඉටුකිරීම සඳහා පිහිටුවනු ලැබූ උසාවිවලිනුත් දුප්පතුන්ට කිසිදු පිළිසරණක් නොලැබුණු බව පෙනී යයි.

### හැරී එන ලෙස ජනතාවට ආයාචනය

දෙවියන් වහන්සේ, නොයෙකුත් ක්‍රියා මඟින් ජනතාව තමන් වහන්සේ වෙත හැරී එන ලෙස මග පෙන්වුවත් ඔවුන් එසේ නොකළ බව ආමොස් සඳහන් කරයි.

දෙවියන් වහන්සේ වැස්ස වළක්වා සාගත කාලයක් ඇති කළ නමුදු (ආමොස් 4: 6, 7) ඔවුහු දෙවියන් වහන්සේ වෙත හැරී ආවේ නැත. වසංගත පැමිණිය ද (ආමොස් 4: 10) සෙනගගේ ජීවිතවල වෙනසක් සිදු නොවුණි.

ආමොස් දෙවියන් වහන්සේ දෙන දඬුවම ප්‍රකාශ කරන අතර ම ඔවුන්ගේ ජීවිත සැබෑ පසුතැවීමකින් යුක්තව වෙනස් වීම සඳහා තදබල ආයාචනයක් කරයි. (ආමොස් 4:8, 5: 6)

## පුද පූජාවල අරුත් සුන් බව

ඉශ්රායෙල්වරු අයුක්ති සහගත ජීවිත ගත කරමින් ම ආගමික කාර්යයන්වල නියැලුණා හ. ඔවුහු දසයෙන් කොටස පුද කරමින්, මුහුන් මුසු තුති පූජා ඔප්පු කළහ (ආමොස් 4: 4) බෙයර් ෂෙබා, බෙතෙල්, ගිල්ගාල්වල නොයෙකුත් ආගමික පුද පූජා ස්ථානවලට ගිය ඔවුනට ආමොස්ගේ අවවාදය වූයේ එසේ යෑමෙන් ඉන් පලක් නොමැති බවයි (ආමොස් 4: 5). ඉන් පලක් නැතිවා පමණක් නොව දෙවියන් වහන්සේ ඔවුන්ගේ මංගල්‍යවලට ද්වේෂ කරන බවත්, දවන යාග පූජා, ආහාර පූජා යනාදිය ප්‍රතික්ෂේප කරන බවත් ආමොස් පවසයි (ආමොස් 5: 21, 22)

## සියලු බලැති දෙවි සමිඳාණන්ගේ විනිශ්චය

ආමොස් සිය දිවැසාවලියේ, දේව විනිශ්චය පිළිබඳ සඳහන් කරද්දී දෙවියන් වහන්සේ "සියලු බල ඇති දෙවි සමිඳාණන් වහන්සේ" ලෙසින් හඳුන්වයි. මේ මගින් දෙවියන් වහන්සේගේ බලය හා මහිමය විස්තර කෙරේ. උන්වහන්සේ අයුක්තිය හා අසාධාරණ ලෙස ක්‍රියා කරන්නවුන් විනිශ්චයට ලක් කරන අතර දුප්පතුන්ගේ පැත්ත ගනිමින් ඔවුන් ආරක්ෂා කරන බලවත් දෙවි සමිඳාණන් වහන්සේ බව වැඩිදුරටත් විග්‍රහ කරයි.

## ආමොස්ගේ පණිවුඩය අපගේ ජීවිතවලට අදාළ කර ගනිමු.

## යුක්තිය පිළිබඳ දැනීම හා සැලකිලිමත් වීම.

අප ජීවත්වන ලොව අසාධාරණය රජකරයි. අපි රැකියා ක්ෂේත්‍රය සලකා බලමු. එක ම සුදුසුකම් ඇති දෙදෙනෙක් රැකියාවකට අයදුම් කළ විට, වැඩි බලපෑමක් කළ හැකි පුද්ගලයාට එය ලැබේ. අනෙකාට සිදුවන්නේ අසාධාරණයකි. ආගමික හා වාර්ගික අසාධාරණ ද අපට නිතරම පෙනේ. මෙහිලා කිතුනුවකුගේ වගකීම වන්නේ පළමුව මෙවැනි අවස්ථා ගැන අවධානයෙන් හා දැනීමෙන් යුතුව සිටීම යි. ආමොස් දිවැසිවරයා ප්‍රකාශ කරන "යුක්තිය ගලා බසින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්" (ආමොස් 5:21) යන්න සෑම සමාජයක ම ක්‍රියාකාරිත්වයට වැදගත් වන්නකි.

## දෙවියන් වහන්සේ හා යුක්තිය

අප විසින් තේරුම් ගත යුතු වැදගත් ම කරුණ වන්නේ, දෙවියන් වහන්සේ සියල්ලන්ගේ පියාණන් වහන්සේ නිසා, උන්වහන්සේ ම යුක්තිය පිහිටුවාලීම සඳහා මැදිහත් වන බවයි. ජේසුස් සමිඳාණන් වහන්සේ නාසරෙත් නුවරට පැමිණ කළ මුල් ම දේශනාවෙන් මේ කරුණු වඩාත් පැහැදිලි වේ. (ලූක් 4: 18-19).

### ක්‍රියා මාර්ගවලට පිවිසීම

මෙවැනි අවස්ථාවල පළමු ක්‍රියා මාර්ගය විය යුත්තේ නමස්කාරයෙන් දෙවියන් වහන්සේට කරුණු ඉදිරිපත් කිරීමයි. අප, නමස්කාරයේ යෙදී සිටින විට දෙවියන් වහන්සේ යුක්තිය හා සාධාරණත්වය පිහිටුවීම සඳහා අපට විවිධ මාර්ග පෙන්වන සේක. වැරදි පෙන්වාදීම, ප්‍රවෘත්ති පත්‍රවලට ලිවීම, සමාජ අසාධාරණකම්වලට විරෝධය

ප්‍රකාශ කිරීම වැනි දෑ එවන් ක්‍රියාමාර්ගයන් ය. මේ සඳහා අපගේ තත්ත්වය වැදගත් නොවේ. අවශ්‍ය වන්නේ, අපගේ නමස්කාරය දේව කැමැත්තට අනුව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමයි. එවිට නමස්කාරය දෙවිඳුන්ට ප්‍රසන්න වනු ඇත.

## පෞද්ගලික කැපවීම

ජේසුස් වහන්සේ අපට ඉගැන්වූයේ දේව රාජ්‍යය අපගේ ප්‍රධාන ඉලක්කය කරගත යුතු බව යි. යුක්තිය හා සාධාරණත්වය පිහිටුවීම මේ ඉලක්කයේ වැදගත් කොටසකි. මේ ඉලක්කය කරා ළඟාවීමේ දී දෙවියන් වහන්සේ මත යැපෙමින්, තමන්ගේ කාලය හා ශ්‍රමය යොදමින් කැපවීම උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නකි. අපත් වර්තමාන සමාජය තුළ එවන් කැපවීමක් ඇතිව දිවි ගෙවන්නට වෙහෙසෙමු.

**ක්‍රියාකාරකම්**

1. ආමොස් 4 හා 5 පරිච්ඡේදවලින් හෙළි කරන සමාජයේ විවිධ අසාධාරණකම් පිළිබඳ කරුණු ගොනු කරන්න.